

මේ පින්වත් දරුවා අධ්‍යාපනය ලැබීමට ගියේ අසල ගමේ තිබූ වීදියගොඩ පාසලටයි. ඔහු එහි දෙවන පන්තිය දක්වා ඉගෙනීම කළේ ය. ඒ දිනවල බුරුම ජාතික යූ. විනයාලංකාර නම් හිමිපාණන් වහන්සේ හොරණ ප්‍රදේශයට වැඩම කොට කළුපහන නමැති කන්දේ ගල්ගුහාවක වැඩ සිටියහ. උන් වහන්සේ හොඳින් සිංහල භාෂාව නොදන සිටියත් දන්නා තරමින් එම ගම් ප්‍රදේශයේ ජනතාවට ධර්මය දේශනා කළහ. මෙම ධර්ම දේශනාවල විශේෂත්වයක් වූයේ මහණකමේ අගය නිතර පෙන්වා දීමයි. එයට හේතුවක් වන්නට ඇත්තේ බුරුම රටේ බොහෝ දෙනකු ටික කලකට හෝ පැවිදි වී කටයුතු කිරීම විය හැකි ය. මේ නිසා ම ගමේ කවුරුත් තම දරුවකු පැවිදි කිරීමට කැමැත්තක් දැක්වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස දෙමාපියන්ගේ ආශීර්වාද ඇතිව ගමේ දරුවන් විසිහත්දෙනෙක් පැවිදි වීමට කැමැත්ත පළකළහ. බුරුම ජාතික විනයාලංකාර හාමුදුරුවන් වහන්සේ එම දරුවන් විසිහත්දෙනා ම පැවිදි කළහ. ක්‍රි.ව. 1906 ජනවාරි 08 වනදා පාසල් අධ්‍යාපනය නතර කර පැවිදි දිවියට ඇතුළත් වූ රුබෙල් ගුණවර්ධන ද මෙම පිරිසට අයත් වූ අතර ඔහු පැවිදි වීමෙන් පසු ව රේරුකානේ චන්දවිමල යන නමින් හඳුන්වනු ලැබිණි.

මෙසේ පැවිදි වූ සාමණේරයන් වහන්සේලාට වැඩි කාලයක් ලංකාවේ වැඩ සිටීමට හැකි වූයේ නැත. උන් වහන්සේලා සියලු දෙනා ම 1908 ජනවාරි 27 දින විනයාලංකාර හිමියන් විසින් බුරුම රටට (මියන්මාරයට) කැඳවාගෙන යන ලදහ. සිංහල භාෂාව හැර කිසි ම භාෂාවක් නොදන බුරුම රටට වැඩිය මේ පොඩි හාමුදුරුවරුන් පිරිසට මුල දී අධ්‍යාපනය ලැබීම කෙසේ වුවත් කතාබහ කිරීම පවා අපහසු විය. එහෙත් උන් වහන්සේලා ටික කලකින් බුරුම භාෂාව හොඳින් ඉගෙන ගත්හ. ඒ අතර සූත්‍ර, විනය හා අභිධර්මය ඉතා හොඳින් ප්‍රගුණ කළහ. ත්‍රිපිටකය පමණක් නොව තම භික්ෂු ජීවිතයට අවශ්‍ය කරන ඇවතුම් පැවතුම් මෙන් ම භාවනාව ද හොඳින් ප්‍රගුණ කළහ. බුරුමයේ ඉතා දන උගත්

භික්ෂූන් වහන්සේලා වෙතින් අධ්‍යාපනය ලද මේ සාමණේරයන් වහන්සේලා අතර රේරුකානේ හිමියෝ ඉතා දක්ෂ අයුරින් ත්‍රිපිටකය පමණක් නොව බුරුම භාෂාවෙන් ලියවී ඇති අභිධර්ම ග්‍රන්ථ ආදිය පවා ඉගෙන ගත්හ. උන් වහන්සේ බුරුම භාෂාව ඉතා හොඳින් ලිවීමට කියවීමට දක්ෂයෙක් වූහ. එසේ ම වසර 10 ක් පමණ බුරුමයේ අධ්‍යාපනය ලබා, උන් වහන්සේ 1917 ඔක්තෝබර් 26 වෙනි දින බුරුම රටේ ධම්මිකාරාම සීමාවේ දී අධිසීල සංඛ්‍යාත උපසම්පදාව ලබාගත්හ.

උපසම්පදාව ලබා ටික කලකින් ලංකාවට වැඩම කළ උන් වහන්සේ දෙමටගොඩ මහා විශුද්ධාරාම පන්සලේ වැඩ සිටියහ. එම පන්සලේ වැඩසිටි සිරිධම්ම නම් නාහිමිපාණන් වහන්සේ අභිධර්මය උගන්වන අතර රේරුකානේ හිමියෝ ද එම පන්තියට ගොස් උගන්වන ආකාරය බලා සිටියහ. ටික දිනකින් සිංහල ඉගෙනගත් උන් වහන්සේ එම පන්තියේ අයට අභිධර්මය ඉගැන්වූහ. කුඩා කාලයේ බුරුමයට වැඩම කළ නිසා සිංහල භාෂාව පිළිබඳ හොඳ හැකියාවක් නොතිබූ උන් වහන්සේ ජාතක පොත, සද්ධර්ම රත්නාවලිය, පූජාවලිය වැනි පොත් කියවා සිංහල භාෂාව පිළිබඳ දැනුම වර්ධනය කරගත්හ. ඒ නිසා ම උන් වහන්සේ විසින් රචනා කරන ලද පළමු ග්‍රන්ථය වූ නිර්වාණ විනිශ්චයේ අපේ පැරණි පොත් තුළ භාවිත වන වචන යොදා තිබෙන බව පෙනේ. මුල්කාලයේ සිංහල වචන නොදන්නා නිසා තමා එසේ ලීව ද අනෙක් ග්‍රන්ථ රචනා කිරීමේ දී සරල වචන යොදා ඇති බව පසු කාලයක උන් වහන්සේ ම සඳහන් කළහ.

අතිගරු රේරුකානේ මහ නාහිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ සංඛ්‍යාව විසිපහකටත් වැඩි ය. ථේරවාදී පිළිගැනීම්වලට එකඟ ව මෙන් ම මතභේදයකට තුඩු නොදෙන ආකාරයට උන් වහන්සේ ඒ සෑම ග්‍රන්ථයක් ම රචනා කොට ඇත. ත්‍රිපිටකයේ සඳහන් කරුණු මතුකරමින් පොත් ලිවීම උන් වහන්සේ තුළ තිබූ අපූරු හැකියාවකි. තමා ලියූ දෙයක් නැවත කපා හරි වැරදි හැදීමක් ද කටුසටහන් ලියා පසු ව නිවැරදි ව ලිවීමක් ද උන් වහන්සේගේ ජීවිතයේ තිබුණේ නැත. ලියන දේ එක වතාවෙන් ම ලියා මුද්‍රණයට යැවීම සිරිතයි. අද ලංකාවේ අයට පමණක් නොව ලෝකයේ බොහෝ සිංහල ජනතාවට මෙම ග්‍රන්ථ වැදගත් වී ඇත.

එසේ රචිත ග්‍රන්ථ අතර පෙහෙවස් සමාදන් වූ උපාසක උපාසිකාවන් උපෝසථ අෂ්ටාංග ශීලය රකිමින් කල් ගතකළ යුතු ආකාරය ගැන උපදෙස් ලබාදෙන **පොහොය දිනය** ග්‍රන්ථයත්, සමාජයේ බොහෝ දෙනා අතර ඇති ප්‍රශ්න සියයකට පිළිතුරු සපයෙන **ධර්ම විනිශ්චය** ග්‍රන්ථයත්, බෞද්ධ ජීවිතයක් හොඳින් ගතකරන ආකාරය විස්තර කෙරෙන **බෞද්ධයාගේ අත්පොත** ග්‍රන්ථයත්, දස පාරමිතා පිළිබඳ දීර්ඝ විස්තරයක් කෙරෙන **පාරමිතා ප්‍රකරණය** ග්‍රන්ථයත්, අභිධර්මය ඉගෙන ගැනීමට කැමැති අයට ඉහළ දැනුමක් ලබා දෙන **අභිධර්ම මාර්ගය** ග්‍රන්ථයත් ඉතා ප්‍රයෝජනවත් ග්‍රන්ථ කිහිපයකි.

උන් වහන්සේ පිරිවෙන් අධ්‍යාපනය හෝ විශ්වවිද්‍යාල අධ්‍යාපනය හෝ ලබා උපාධි ලද කෙනෙක් නොවූහ; බුරුමයට ගොස් පන්සල් අධ්‍යාපනය ලැබීමෙන් හා භාවනා කිරීමෙන් ලැබූ දැනුමෙන් සිය ග්‍රන්ථ රචනා කොට ඇත. මෙම ග්‍රන්ථ කොපමණ වැදගත් ද යන්නට හොඳ ම සහතිකය වන්නේ උන් වහන්සේගේ හැකියාව දන්න විශ්වවිද්‍යාල හා

අධ්‍යාපන ආයතනාදියෙන් උන් වහන්සේට පිරිනැමූ උපාධි සහතිකයි. ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පාලි, සංස්කෘත, සිංහල භාෂා පිළිබඳ හසළ දැනුමක් ඇති අයට දෙනු ලබන උපාධියක් වන "සම්මාන පණ්ඩිත" උපාධිය උන් වහන්සේට පිරිනැමිණි. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය (වර්තමාන කැලණිය විශ්වවිද්‍යාලය) මගින් අභිධර්මය පිළිබඳ මහාචාර්ය පදවියක් ද එම විශ්වවිද්‍යාලය මගින් ම 1963 වර්ෂයේ දී සාහිත්‍ය චක්‍රවර්ති උපාධිය ද පිරිනැමිණි. අනුරාධපුර බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය මගින් ප්‍රවචන විශාරද සම්මාන උපාධිය ද පිරිනැමුණ අතර 1976 වර්ෂයේ දී ශ්‍රී ලංකා ශ්වෛජින් නිකායේ මහානායක පදවිය ද 1995 වර්ෂයේ දී අමරපුර මහා සංඝ සභාව මගින් අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන යන ගෞරව නාමය ද උන් වහන්සේ වෙත පිරිනමා ඇත.

මෙතරම් ගරුනාම, උගත්කම් තිබුණ ද උන් වහන්සේ ඉතා චාම් අල්පේච්ඡ ජීවිතයක් ගත කළහ. මොන නායකකම් තිබුණ ද උන් වහන්සේ කුඩා කාමරයක් තුළ ඉතා නිහතමානී දිවිපෙවෙතක් ගෙවූ බව බොහෝ දෙනා දන්නා කරුණකි. ධර්ම ග්‍රන්ථ රාශියක් රචනා කළ ද ඒ හැම එකක් ම පුටුවේ හිඳගෙන කුඩා ලෑලි කෑල්ලක් මත තබාගෙන ලියා ඇත. වටිනා මේස, පුටු, ඇඳ ඇතිරිලි, බුමුතුරුණුවලින් යුක්ත වූ සුඛෝපභෝගී දිවිපෙවෙතක් නොගෙවූ අප හිමිපාණන් වහන්සේ තමා රචනා කළ ග්‍රන්ථ විකුණා මුදල් සෙවීමට සූදානම් වූයේ ද නැත. ඒවා හුදෙක් ම ධර්ම දානය පිණිස ම රචනා කළ බව නොරහසකි. ඒ බව උන් වහන්සේගේ ග්‍රන්ථයක ම සඳහන් කොට ඇත්තේ මෙසේ ය.

"මම පොත් රචනා කළේ මුදල් හම්බ කිරීමේ අදහසින් නොවෙයි. මගේ පොතක් වෙන කවුරුන් හෝ මුද්‍රණය කළාට, මගේ පොත්වල කොටස් උපුටා ගත්තාට, මගේ නමක් මකලා වෙන කෙනෙකුගේ ම නමින් මුද්‍රණය කළාට මගේ නම් කිසි ම විරුද්ධත්වයක් නැහැ. ඒක නීති විරෝධී වුණාට මගෙන් නම් තහනමක් නැහැ."

උන් වහන්සේ කුමන ආකාරයේ කෙනෙකු ද යන්නට ඉහත පාඨය ම ප්‍රමාණවත් වේ. උන් වහන්සේ භාවනාව ගැන පොත් රචනා කළේ තමන් වහන්සේ ලත් අත්දැකීම් ඇතිව ය. බුදු බණ තම ජීවිතයට ළංකරගෙන සුපේශල ශික්ෂාකාමී දිවිපෙවෙතක් ගෙවූ උන් වහන්සේ අපවත් වීමට පෙර ස්වකීය ආදාහනය සිදු කරන ආකාරය ද ලියා තැබීම විශේෂත්වයකි. උන් වහන්සේගේ ඉල්ලීම වූයේ ලස්සන පෙට්ටියක තබා, කොඩි දමා, තොරණ ගසා, මහා චිතකවලින් සරසා ලොකු ආදාහන උත්සවයක් කිරීම නොව තමන් වහන්සේ දහවල් විවේක ගන්නා කුඩා ඇඳ පිටින් ම වත්තේ දර ගොඩක් ගසා ඒ මත තබා ආදාහනය කරන ලෙස ය. තම සිරුර ද දින ගණන් තබා නොගෙන දර ගොඩ ගසා අවසන් වූ විගස ආදාහනය කොට අන් අයට දැනුම් දෙන ලෙස එහි සටහන් කොට තිබිණි. සෑම දෙයක් ම අනිත්‍ය බව ලෝකයාට පසක්කර දෙමින් උන් වහන්සේ 1997 ජූලි 04 දින සිහියෙන් යුතු ව අපවත් වූ සේක. උන් වහන්සේගේ ඉල්ලීම මත ආදාහනය ඉතා චාම් ආකාරයට සිදුකොට පින් අනුමෝදන් කෙරිණි.